# කෝර්ටිකෝස්ටෙරොයිඩ ප්‍රතිකාරය (Corticosteroids)

කෝර්ටිකෝස්ටෙරොයිඩ කාණ්ඩයට අයත් විවිධ ඖෂධ නොයෙක් සමේ රෝග සඳහා ප්‍රතිකාර ලෙස භාවිතාවේ. මෙම ඖෂධ මගින් රෝගී තත්ත්වය නිසා සමේ ඇතිවන ප්‍රදාහය පාලනය කිරීම මඟින් රෝග ලක්ෂණ සමනය කිරීමක් සිදු කරයි. මෙම ඖෂධ රෝග තත්ත්වය සාර්ථක ලෙස පාලනය කිරීම සඳහා යොදා ගත හැක.

## (1) මෙම කාණ්ඩයට අයත් ඖෂධ වර්ග මොනවාද?

- ක්‍රීම් - (හයිඩ්‍රොකෝර්ටිසෝන්, බීටාමෙතසෝන්, මොමෙටසෝන්, ක්ලොබීටසෝල් ආදිය)
- පෙති - (ඩෙක්සමෙතසෝන්, ප්‍රෙඩ්නිසොලෝන්, බීටාමෙතසෝන් ආදිය)
- එන්නත් - (බීටාමෙතසෝන්, ට්‍රයම්සිනලෝන්)

## (2) මෙම ප්‍රතිකාරය භාවිතා කළ හැකි රෝග වර්ග මොනවාද?

- චර්ම ප්‍රදාහය (Eczema)
- පොතු කබර
- සුදු කබර
- වෛද්‍යවරයා විසින් නිර්ණය කරන වෙනත් සමේ රෝග වර්ග

## (3) කෝර්ටිකෝස්ටෙරොයිඩ ආලේපන භාවිතා කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද?

- ආලේප කල යුතු ස්ථානය, වාර ගණන හා කාල සීමාව පිළිබඳව වෛද්‍ය උපදෙස් නිසි ලෙස පිළිපදින්න.

- මෙම ඖෂධ සාමාන්‍යයෙන් දිනකට වරක් හෝ දෙවරක් ආලේප කළ යුතුය.

- ආලේප කළ යුතු ප්‍රදේශය මත ඉතා තුනී ආලේප තට්ටුවක් රැඳෙන සේ ආලේපන තවරන්න.

- රෝම වැවෙන දිශාවට ආලේප තවරන්න.
  උදා:- අත් පා වල උඩ සිට පහළට පමණක්

- ඔබට කෝර්ටිකෝස්ටෙරොයිඩ ආලේපන වර්ග කීපයක් සමේ විවිධ ස්ථාන වලට ආලේප කිරීම සඳහා ලැබී ඇත්නම් ඒවා ආලේප කළයුතු ආකාරය සැකහැර දැනගන්න.

## (4) මෙම ප්‍රතිකාරයේ අතුරු ආබාධ (සංකූලතා) මොනවාද?

භාවිතා කරන ඖෂධයේ සැර (Potency), සාන්ද්‍රණය, ප්‍රතිකාර කරන කාල සීමාව හා ආලේප කරන ස්ථානය අනුව අතුරු ආබාධ ඇතිවීමේ ප්‍රවණතාවය තීර්ණය වේ.

අනිසි ලෙස මෙම ඖෂධ ආලේප කිරීමෙන් ඇතිවිය හැකි සංකූලතා

- සම තුනී වීම
- සම ලා පැහැ ගැන්වීම
- කුරුලෑ හටගැනීම
- ආසාදන ඇතිවීම
- අධික ලෙස රෝම වැවීම
- ඇදීම් ලකුණු (Stretch marks) ඇතිවීම

වෛද්‍ය උපදෙස් නිසි ලෙස පිළිපැදීමෙන් මෙම ගැටලු වළක්වා ගත හැක.

කෝටිකෝස්ටෙරොයිඩ ඖෂධ පෙති දීර්ඝ කාලයක් ලබා ගැනීමෙන් පහත අතුරු ආබාධ ඇතිවීමට ඉඩ ඇත.

- ස්ථුලතාව
- ඇසේ සුද
- කුරුලෑ
- අස්ථි ඝනත්වය අඩුවීම
- අධිරුධිර පීඩනය
- රුධිර සීනි මට්ටම ඉහළ යාම
- මානසික අවපීඩනය
- මාංශපේෂි දුර්වලතාව
- ආසාදනවලට ගොදුරු වීම

## (5) මෙම ප්‍රතිකාරය භාවිතා නොකළ යුතු අවස්ථා මොනවාද?

- සමේ ආසාදන ඇති විට
- සමහර චර්ම රෝග පවතින ස්ථානවල (උදා:- කුරුලෑ, Rosacea)

## (6) ප්‍රතිකාරය ලබාගන්නා රෝගීන් සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද?

- මෙම ප්‍රතිකාර (ආලේපන හෝ පෙති) වෛද්‍යවරයා නිර්දේශ කරන කාල සීමවට පමණක් භාවිතා කළ යුතුය. නිසි වෛද්‍ය නිර්දේශයක් නොමැතිව ඖෂධ වෙළඳසැල් වලින් මිලදී ගැනීම නොකළ යුතුයි.

- යම් රෝගී තත්ත්වයක් සඳහා දීර්සකාලීනව මෙම ඖෂධ පෙති භාවිතා කළ අයෙකු එකවරම ප්‍රතිකාරය නැවැත්වීම කිසිසේත් නොකළ යුතුය.

- එසේ කළහොත් ඉතා අවදානම් තත්ත්ව වලට ඔබ ගොදුරු වීමේ හැකියාවක් ඇත.

- ප්‍රතිකාරය නැවැත්වීමට ඔබේ වෛද්‍යවරයා තීරණය කළ විට එය ක්‍රමයෙන් අඩු කරන අයුරු ඔබට උපදෙස් දෙනු ඇත.